**ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය**
පශ්චාද් උපාධි, බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (බාහිර) සඳහා අයදුම්පත් කැඳවීම (09 වන කණ්ඩායම)**
**2024 වර්ෂය**

**1. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි (බාහිර) පාඨමාලාවට ඇතුළත්වීම සඳහා සලකා බලන අවම සුදුසුකම්**

(අ) බුද්ධධර්මය, බෞද්ධශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත, සිංහල යන විෂයයන්ගෙන් අවම වශයෙන් එක් විෂයක්වත් සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබීම.

**හෝ**

(ආ) ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලබා තිබීම හා සාමාන්‍ය පොදු පරීක්ෂණයට අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබීම

සහ

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දි බුද්ධධර්මය විෂයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව සමත්වීම හෝ දහම් පාසල් අවසාන පරීක්ෂණය සමත්වීම.

**හෝ**

(ඇ) ප්‍රාචීන මධ්‍යම විභාගය භාෂාත්‍රයෙන් සමත්වීම

**හෝ**

(ඈ) ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් විභාගයකින් සමත්වීම

**2. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි (බාහිර) පාඨමාලාව සඳහා අනුමත විෂය පාඨමාලා**

**(අ) ප්‍රධාන විෂය පාඨමාලා**

ඒ ඒ අධ්‍යයන වර්ෂය සඳහා අනුමත වන පහත සඳහන් ප්‍රධාන විෂයයන් අතුරින් අංක 3 (අ) වගන්තියේ උපදෙස් අනුව ප්‍රධාන විෂයයන් 03 ක් උපාධි අපේක්ෂකයා / අපේක්ෂිකාව විසින් හැදෑරිය යුතුය.

| අනු අංකය | විෂය නාමය | විෂය සංකේත නාමය |
|---|---|---|
| 1 | බෞද්ධදර්ශනය | E/BUPH |
| 2 | බෞද්ධශිෂ්ටාචාරය | E/BUCZ |
| 3 | පාලි | E/PALI |
| 4 | සංස්කෘත | E/SANK |
| 5 | සිංහල | E/SINH |
| 6 | ඉංග්‍රීසි | E/ENGL |
| 7 | අධ්‍යාපනවිද්‍යාව | E/EDSC |
| 8 | දර්ශනය | E/PHIL |

| | | |
|---|---|---|
| 9 | මනෝවිද්‍යාව | E/PSYC |
| 10 | පුරාවිද්‍යාව | E/ARCH |
| 11 | සමාජවිද්‍යාව | E/SOCI |
| 12 | පුස්තකාල හා විඥාපනවිද්‍යාව | E/LISC |
| 13 | උරුම කළමනාකරණය | E/HEMG |
| 14 | ඉතිහාසය | E/HIST |
| 15 | බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය | E/BPCO |

**(ආ) අනිවාර්ය පදනම් පාඨමාලා**

උපාධි පාඨමාලාවට අදාළ වර්ෂ තුනේදී ම (03) උපාධි අපේක්ෂකයා / අපේක්ෂිකාව විසින් පහත සඳහන් විෂයයන් හැදෑරීම අනිවාර්ය වේ.

| අනු අංකය | විෂය නාමය | විෂය සංකේත නාමය |
|---|---|---|
| 1 | තොරතුරු තාක්ෂණය | E/COIT |
| 2 | අනිවාර්ය ඉංග්‍රීසි | E/COEN |

**(ඇ) අනිවාර්ය අතිරේක පාඨමාලා**

පහත වගුවට අනුව ඒ ඒ අධ්‍යයන වර්ෂයට නියමිත විෂය පත්‍ර දෙක (02) අතුරින් තම අභිමතය පරිදි එක් අධ්‍යයන වර්ෂයකට එක් විෂය පත්‍රයක් බැගින් අධ්‍යයන වර්ෂ තුනට (03) විෂය පත්‍ර 03 ක් උපාධි අපේක්ෂකයා / අපේක්ෂිකාව විසින් හැදෑරිය යුතුය.

| අනු අංකය | විෂය නාමය | විෂය සංකේත නාමය | අදාළ අධ්‍යයන වර්ෂය |
|---|---|---|---|
| 1 | සිංහල ලේඛන කුසලතා | E/SUSI | පළමු අධ්‍යයන වර්ෂයට නියමිත |
| 2 | බෞද්ධ ආචාර විද්‍යාව | E/SUBE | |
| 3 | තාර්කික චින්තනය හා විද්‍යාත්මක ක්‍රමවේදය | E/SULO | දෙවන අධ්‍යයන වර්ෂයට නියමිත |
| 4 | බෞද්ධ මනෝ උපදේශනය | E/SUBP | |
| 5 | සමයාන්තරික අධ්‍යයනය | E/SUCS | තෙවන අධ්‍යයන වර්ෂයට නියමිත |
| 6 | සාමාන්‍ය කළමනාකරණය | E/SUGM | |

- ➢ මීට අතිරේකව උපාධි අපේක්ෂකයින් විසින් උපාධි පාඨමාලාව සඳහා පහත සඳහන් අනිවාර්ය පාඨමාලාව අධ්‍යයනය කළ යුතුය.

❖ අනිවාර්ය වැඩ පදනම් කරගත් පුහුණුව (Compulsory Work Based Training)

- රැකියාවක් කිරීම සඳහා අවශ්‍ය මූලික භාෂා දැනුම, පරිගණක ආශ්‍රිත තාක්ෂණික හා සන්නිවේදන දැනුම, ප්‍රායෝගික පුහුණුව ඇතුළත් වන පරිදි ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි පාඨමාලාව (බාහිර) සඳහා අවම පැය 300ක් ආවරණය වන පරිදි රැකියා ඉලක්ක කර ගනිමින් අනිවාර්ය වැඩ පදනම් කර ගත් පුහුණුව (Compulsory Work Based Training) අනිවාර්ය විෂයක් ලෙස සෑම උපාධි අපේක්ෂකයෙකුම සම්පූර්ණ කළ යුතුය.
- එම විෂයය යටතේ රැකියාවල නියුතු උපාධි අපේක්ෂකයින් තම සේවා ස්ථානවල දී ප්‍රායෝගික පුහුණුව ලැබිය හැකිය.

- රැකියා විරහිත උපාධි අපේක්ෂකයින් ඔවුන් විසින් යෝජනා කරනු ලබන ස්ථානයක රැකියා පුහුණුව ලැබිය හැකි අතර, රැකියා පුහුණුව ලබන කාලය තුළදී දෛනික වාර්තා පොතක් උපාධි අපේක්ෂකයින් විසින් භාවිත කළ යුතුය.
- එය තුන්වන වසරට අදාළ පාඨමාලාවක් වුවත් පළමු වසර අවසන් වූ පසු ඕනෑම අවස්ථාවක එම පුහුණුව ආරම්භ කළ හැකිය.
- එමෙන්ම එම පාඨමාලාවෙන් අර්ඝ 03 ක් උපයාගත යුතු වුවත් එය ශ්‍රේණි ලකුණු සාමාන්‍යය (GPA) ගණනය කිරීම්වලට අදාළ නොවන අතර අවසන් ප්‍රතිඵල ලේඛනයේ එම විෂයයට අදාළ ප්‍රතිඵලය ඇතුළත් කරනු ලැබේ.

**3. ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි (බාහිර) පාඨමාලාව සඳහා විෂයයන් තෝරා ගැනීම**

(අ) විෂයයන් තෝරා ගැනීමේ දී පහත සඳහන් ක්‍රියා පටිපාටිය අනුගමනය කළ යුතු ය.

- උපාධි අපේක්ෂකයන් විසින් බෞද්ධදර්ශනය සහ බෞද්ධශිෂ්ටාචාරය යන විෂයයන් දෙකෙන් එක් විෂයයක් අනිවාර්යයෙන් තෝරාගත යුතු අතර, පහත සඳහන් එක් බාණ්ඩයකින් එක් විෂයයක් බැගින් බාණ්ඩ තුනෙන් තවත් විෂයයන් දෙකක් තෝරාගත යුතු ය.

| පළමු ඒකකය | දෙවන ඒකකය | තෙවන ඒකකය |
|---|---|---|
| 1. සමාජවිද්‍යාව | 1. පාලි | 1. දර්ශනය |
| 2. මනෝවිද්‍යාව | 2. සංස්කෘත | 2. උරුම කළමනාකරණය |
| 3. ඉතිහාසය | 3. පුරාවිද්‍යාව | 3. අධ්‍යාපනවිද්‍යාව |
| 4. සිංහල | 4. ඉංග්‍රීසි* | 4. බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය |
| | 5. පුස්තකාල හා විඥාපන විද්‍යාව | |

මේ සඳහා අයදුම්පත්‍රයේ අංක 17.1 යටතේ දක්වා ඇති වගුවෙහි ඉහතින් සඳහන් කර ඇති පරිදි උක්ත බාණ්ඩවලින් එක් විෂයය බැගින් බාණ්ඩ දෙකකින් විෂය කැමැත්තේ අනුපිළිවෙළට විෂයයන් තෝරාගෙන සඳහන් කරන්න.

උදාහරණයක් ලෙස ගත් කළ එම විෂයයන් දෙක (02) ඔබ විසින් පළමු සහ තෙවන ඒකකය තුළින් තෝරාගනු ලබන්නේ නම් දෙවන ඒකකයෙහි ඇති විෂයයන් ඔබ විසින් අත්හැරිය යුතු ය. ඒ අනුව, පළමු සහ තෙවන බාණ්ඩයෙන් තෝරාගනු ලබන විෂයයන් තම විෂය කැමැත්තේ අනුපිළිවෙළ අනුව ඊට අදාළ වගුව තුළ සඳහන් කළ යුතු ය. එම විෂයයන් තෝරාගැනීමේ පටිපාටිය සඳහා පහත නිදසුන අනුගමනය කරන්න.

උදා :-

| පළමු ඒකකය | |
|---|---|
| අනු අංකය | තෝරාගත් විෂයයන් අනුපිළිවෙළට |
| 1 | සිංහල |
| 2 | සමාජවිද්‍යාව |
| 3 | ඉතිහාසය |

| දෙවන ඒකකය | |
|---|---|
| අනු අංකය | තෝරාගත් විෂයයන් අනුපිළිවෙළට |
| 1 | |
| 2 | |
| 3 | |

| තෙවන ඒකකය | |
|---|---|
| අනු අංකය | තෝරාගත් විෂයයන් අනුපිළිවෙළට |
| 1 | අධ්‍යාපනවිද්‍යාව |
| 2 | බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය |
| 3 | උරුම කළමනාකරණය |

* උපාධි පාඨමාලාවට ඉංග්‍රීසි විෂය හැදෑරීමට බලාපොරොත්තු වන අපේක්ෂකයින් පහත සඳහන් මූලික අවශ්‍යතා සපුරා තිබිය යුතුය.

1. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමර්ථ්‍යයක් ලබා තිබීම **හෝ**
2. මෙම විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ඉංග්‍රීසි ඩිප්ලෝමා (බාහිර) පාඨමාලාව සමත්වීම **හෝ**
3. මෙම විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පිළිගන්නා වෙනත් ඉංග්‍රීසි පාඨමාලාවකින් සාමර්ථ්‍යයක් ලබා තිබීම.

(ආ) ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි (බාහිර) පාඨමාලාව වසර තුනකින් සමන්විත වේ. පළමු, දෙවන හා තෙවන (100, 200, 300) යන සෑම වසරක් සඳහා ම අර්ස 32 බැගින් අර්ස 96 ක් ලබාගත යුතු ය.

| | |
|---|---|
| පළමු අධ්‍යයන වර්ෂය | අර්ස 32 |
| දෙවන අධ්‍යයන වර්ෂය | අර්ස 32 |
| තෙවන අධ්‍යයන වර්ෂය | අර්ස 32 |
| **එකතුව** | **අර්ස 96** |
| කාර්ය පදනම් පුහුණුව<br>(GPA අගයට එකතු නොවේ) | අර්ස 03 |

වසරක දී අර්ස 30 සම්පූර්ණ කරන ආකාරය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| ප්‍රධාන විෂය පත්‍ර | 6 x අර්ස 4 | අර්ස 24 |
| අනිවාර්ය පදනම් පාඨමාලා | 2 x අර්ස 3 | අර්ස 6 |
| අනිවාර්ය අතිරේක පාඨමාලා | 1 x අර්ස 2 | අර්ස 2 |
| **එකතුව** | | **අර්ස 32** |

**සටහන :** 01. සෑම උපාධි අපේක්ෂකයෙකුටම භාෂා නිපුණතාව ලබාදීමේ අරමුණින් පළමු අධ්‍යයන වර්ෂයේ දී අධ්‍යයන කටයුතු සිංහල මාධ්‍යයෙන් ද, දෙවන හා තෙවන අධ්‍යයන වර්ෂයන්හි දී සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යවලින් ද සිදු කරනු ලැබේ.

02. අපේක්ෂකයින් 25 කට වඩා අඩුවෙන් ඉල්ලුම්කර ඇති ප්‍රධාන විෂයයක් හැදෑරීමට සනාතන සභාවේ අවසරය ලැබිය යුතුය. එබැවින් යම් විෂයයක් පවත්වාගෙන යාමට සනාතන සභාවේ අවසරය නොලැබුන හොත් අයදුම්පත්‍රයේ සඳහන් පරිදි විෂය කැමැත්තේ අනුපිළිවෙළ අනුව අපේක්ෂකයා ඊළඟ විෂයයට ලියාපදිංචි කර ගනු ලැබේ.

(ප්‍රථම වර්ෂයේ දී උපාධි පාඨමාලාවට තෝරාගත් ප්‍රධාන විෂයයන් 03, දෙවන හා තෙවන වසරවල දී ද හැදෑරීම අනිවාර්ය වේ.)

ලේඛකාධිකාරි,
ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය,
අනුරාධපුරය.
2024.06.02